(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 44.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 මාර්තු 19 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

506/2025

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කරන ලද ආයතනයක්ද;

(ii) එහි කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පදනම සතු වත්කම් කවරේද;

(iv) වර්ෂ 2020 සිට 2024 දක්වා එම පදනමට අයවැය මඟින් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සඳහන් කාල සීමාව තුළදී එම පදනම විගණනයට ලක් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

507/2025

ගරු දිනේෂ් හේමන්ත මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති විදුලි අලිවැට ආරක්ෂා කිරීම සඳහා බඳවාගෙන ඇති පුහුණු අලිවැට සහායකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට සේවයේ ස්ථිර කර ඇති පුහුණු අලිවැට සහායකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනතෙක් සේවයේ ස්ථිර කර නොමැති පුහුණු අලිවැට සහායකයන්ගේ සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් නීතිමය බාධාවක් තිබේද;

(iv) නොඑසේ නම්, ඔවුන් සේවයේ ස්ථිර නොකිරීමට හේතු කවරේද;

(v) සේවය ස්ථිර කර නොමැති පුහුණු අලිවැට සහායකයින්ගේ සේවය ස්ථිර කිරීම සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් තිබේද;

(vi) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

511/2025

ගරු සුජීව දිසානායක මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ ක්‍රීඩා සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;
(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ ක්‍රීඩා සංකීර්ණයක් පිහිටුවා තිබේද;
(iii) එසේ නම්, එය ස්ථාපිත කර ඇති ස්ථානය කවරේද;
(iv) එම ක්‍රීඩා සංකීර්ණය පළමුව ඉදිකිරීමට යෝජිතව තිබූ ස්ථානය කවරේද;
(v) එය වෙනත් ස්ථානයක ඉදිකිරීමට කටයුතු කරනු ලැබුවේද;
(vi) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩා සංකීර්ණයේ පහසුකම් සැපයීමට නියමිතව තිබූ ක්‍රීඩා කවරේද;
(ii) එම ක්‍රීඩා සංකීර්ණයේ මේ වනවිට පහසුකම් සපයා ඇති ක්‍රීඩා කවරේද;
(iii) එම ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර තිබූ මුදල කොපමණද;
(iv) එම ක්‍රීඩා සංකීර්ණය සම්පූර්ණයෙන්ම ඉදිකිරීමට කටයුතු කරන්නේද;
(v) එසේ නම්, එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

514/2025

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රැඳවුම්භාරයේ සිටින දේශපාලන සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;
(ii) එම එක් එක් දේශපාලන සිරකරුවා රඳවාගෙන සිටින කාලය, එරෙහිව ඇති චෝදනා, රඳවා ගැනීමට භාවිතා කර ඇති පනත වෙන් වෙන් වශයෙන් කවරේද;
(iii) එම දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම සඳහා ඇති සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

517/2025

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ මේ වනවිට ජාතික පාසල් ලෙස නම් කරන ලද පාසල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) එම එක් එක් ජාතික පාසලේ නාම පුවරුව හා ප්‍රධාන පිවිසුම් දොරටුව සැකසීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට එම පාසල් පාලනය කරනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශය මඟින්ද; නොඑසේ නම්, අදාළ පළාත් සභාව මඟින්ද;

(iv) ඒ අනුව, මේ වනවිට ස්ථාපිත කර ඇති මුළු ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

(vi) එම ජාතික පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය කර ඒවා රේඛීය අමාත්‍යාංශය යටතට ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂයභාර අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසි නව දෙනෙකුගෙන් (29) සමන්විත විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, නියෝජ්‍ය කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සංශෝධන සහිතව සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් (20) සමන්විත විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 116 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් දස දෙනෙකුගෙන් (10) සමන්විත විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ගෘහ්‍ය කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 117 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ගෘහ්‍ය කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහ අට දෙනෙකුගෙන් (18) සමන්විත විය යුතු ය.

7.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

8.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

9.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— රජයේ මුදල් පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහ අට දෙනෙකුගෙන් (18) සමන්විත විය යුතු ය.

10.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් විසි තුන් දෙනෙකුගෙන් (23) සමන්විත විය යුතු ය.

11.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් විසි නව දෙනෙකුගෙන් (29) සමන්විත විය යුතු ය.

12.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— උසස් නිලතල පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් දහනව දෙනෙකුගෙන් (19) සමන්විත විය යුතු ය.

13.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 129 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන ආණ්ඩු පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් අට දෙනෙකුගෙන් (08) සහ විරුද්ධ පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් අට දෙනෙකුගෙන් (08) සමන්විත විය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත — (විසිහතරවැනි වෙන් කළ දිනය) — කාරක සභාව.
(මාර්තු 18 දින ප්‍රගතිය)

*2.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුදල් පනත යටතේ නියෝගය,— 2012 අංක 12 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු 2013 අංක 12 දරන මුදල් පනතේ 12 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 නොවැම්බර් 22 දිනැති අංක 2411/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.14 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සම්බන්ධයෙන් 2013 ජූලි 26 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, 2013 සැප්තැම්බර් 17 දිනැති අංක 1828/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර එළඹී ගිවිසුම සංශෝධනය කරමින් 2024 දෙසැම්බර් 16 දින ඇති කරගත් 2025.02.20 වැනි දින ඉදිරිපත් කරන ලද සන්ධාන පත්‍රය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 16 වගන්තිය සමඟ කියවිය යුතු 112 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2024 දෙසැම්බර් 22 දිනැති අංක 2415/79 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 27 දිනැති අංක 2421/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තිය යටතේ මත්පැන් සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 10 දිනැති අංක 2418/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.27 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2025 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 10 දිනැති අංක 2418/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.27 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 දෙසැම්බර් 31 දිනැති අංක 2417/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.03.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 27 දිනැති අංක 2421/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.03.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

බලශක්ති අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව (2021),— 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2023.12.13 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

බලශක්ති අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව (2022),— 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2024.03.05 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2021),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය යටතේ 2023.07.05 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.08.24 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.09.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

"විසර්ජන" පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---